15 වන පිටුවෙන් (අදිහ)

මිදුලේ මෝටර් සයිකලයක් නවතන හඬක් ඇසෙයි.

"සුනන්ද අයියා..." වින්ධ්‍යා සාලය දෙසට යමින් කියයි. කුසල් කෑම මේසයෙන් නැගිට එදෙසට යයි.

කිරි හට්ටි කීපයක් දකුණතින් එල්ලාගත් සුනන්ද සාලයට ගොඩ වෙයි.

"මහත්තය දෙන්න කිව්ව.. " ඔහු එය වින්ධ්‍යා අතට දෙන අතර කියයි. ".. අද එන්න වෙන එකක් නෑ කිව්ව.. අධ්‍යාපන සතියේ වැඩ වලට කෙළින්ම අනුරාධපුරේ යනවා කිව්වෙ.."

"අද එන්නෑ කිව්වා...?" ඒ කුසල් ය.

"කිව්වෙ නං එහෙම තමයි.. " සුනන්ද සිනාවක් මුවට නගා ගන්නට වෑයම් කරයි. ".. කුසල් මහත්තය ඇවිත් ඉන්න බව දන්න නිසා රෑ ම ආපනු එයිද දන්නෙත් නැහැ."

පන්සලේදී නායක හාමුදුරුවන් හා රණසිංහ අතර ඇතිවූ කතාව සුනන්ද ගේ සිත පීඩාවට පත් කර ඇත. ලොකු හාමුදුරුවන් මහ ජන්දයට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නට යන්නේ ය යන ආරංචිය ඇසූ පමණින් රණසිංහ එසේ කෝප ගෙන කතා කිරීම සුනන්ද අනුමත නොකරයි. ලොකු හාමුදුරුවන් අතින් වරදක් වුව ද එසේ කතා කිරීම නොහොබින බව ඔහුගේ සිත කියයි. අනෙක් අතින් දේශපාලකයකු ලෙස පන්සල හා හැප්පෙන්නට යාමේ අනුවණ කම රණසිංහට නොතේරීම සුනන්දට තේරුම් ගත නොහැකි ය. කරන්නට තිබුණේ හැප්පෙන්නට යාම නොව උන්වහන්සේ සමග සුහදව කතා කර තමන් දෙසට නම්මා ගන්නා එක ය. බලහත්කාරකම් පානවාට වඩා එය පහසු ය.

"මේ මිනිහා බලයෙන් මත වෙලා.." ඔහුගේ යටි සිත කියයි. ".. ඔලුව ඉදිමිලා.."

වින්ධ්‍යා පන්සලේ සිදුවීම් පිළිබඳ විස්තර නොඇසීම සහනයකි. කොහොමත් අය කිසිවක් හාරා අවුස්සා නාසන බව සුනන්ද අද්දැකීමෙන් දනියි.

ඔහු යන්නට හැරෙයි. ඉක්මණින් ගෙදර යා යුතු ය. හිතට නිදහසක් ලැබෙන්නේ ගෙදරදී පමණකි.

"සුනන්ද.." වින්ධ්‍යා ගේ හඬ පසුපසින් ඇසෙයි. ඔහු නැවතී හැරී බලයි.

"කෑම කාලා යන්න.. එන්න"

ඔහු මදක් නැවතී කල්පනා කරයි. ඇගෙ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නට ඔහුට නොසිතෙයි.

0000000

කිසිදු ගරු සරුවක් නැතිව තමා ඉදිරියේ සිටගත් යුවතිය දෙස අයේෂා බලන්නේ සඟවාගත් අප්‍රසාදයෙනි.

"ආව පිළිවෙලට එන්න.."

"ආව පිළිවෙලට තමයි ආවෙ.. මට කළින් ආව හැමෝම යනකල් මං වාඩි වෙලා බලා හිටියනෙ.."

"මන්ත්‍රීතුමා හමුවෙන්න අද බැරිවෙයි.. දැන් එළියට යන්න ඕනෙ කියලා මට කිව්වා.." අයේෂා මේසය මත දිගහැරගෙන සිටි ලිපිගොණුව වසා දමන අතර කියයි.

"කරුණාකරලා අයෝමා ඇවිත් ඉන්නවා කියලා මන්ත්‍රීතුමාට කියනවද..?" තරුණියගේ කටහඬෙහි රැඳුණු විධානය නොසළකා සිටින්නට නොහැකි බවක් අයේෂාට දැනෙයි. ඇය දෙස නොපහන් බැල්මක් හෙළමින් අයෝමා දුරකතනය අතට ගනියි.

"විසිටර් කෙනෙක් ඉන්නවා සර්.. අයෝමා කියලා."

"ඇතුළට එවන්න.." එය අයේෂා බලාපොරොත්තු නොවූ පිළිතුරක් විය. ඒ විධානයේ තිබූ උද්‍යෝගය ඇය බලාපොරොත්තු නොවූ එකකි.

"විසිටර්ස්ලා එවන්න එපා කියලා සර් කිව්වා නේද..?" ඈ අසන්නේ එනිසා ය.

"කමක් නෑ.. එයාව එවන්න.."

අයේෂා කිසිවක් කියන්නටත් පෙර අයෝමා රණසිංහ ගේ කාමරයට ඇතුල්වෙයි. ඔහු සිටින්නේ කැරකෙන පුටුව බිත්තිය දෙසට හරවාගත්වන ම ය.

"වාඩිවෙන්න අයෝ..." ඔහු කියන්නේ බිත්තිය දෙස බලාගත්වන ම ය. ".. මං දැනගෙන හිටියා ඔයා කවදා හරි මේ දොරෙන් ඇතුළට එන බව.."

අයෝමා ඔහුගේ මේසය ඉදිරියේ වාඩි වෙයි.

"ආවා තමයි.. ඒත් මං වෙනුවෙන් නෙවෙයි.." අත්බෑගය ඔහුගේ මේසය තබන අතර ඕ කියයි. ඔහු බමරයක් සේ කරකැවී ඇයට මුහුණ ලා නැවතෙයි. ඔහුගේ මුහුණේ විඩාපත් බවට යටින් සැඟවගත් ජයග්‍රාහී සිනාව ඇයට පහසුවෙන් හඳුනා ගත හැකි ය.

"කවුරු වෙනුවෙන් උනත් ආවෙ ඔයානෙ... ජන්දෙන් දින්න දවසේ දැනුණ සතුටම දැනෙනවා.." ඔහු සිනාසෙන්නට උත්සාහ කරයි. ".. ඒ සතුට වෙනුවෙන් අද ඔයා ඉල්ලන ඕනෙම දෙයක් කරලා දෙනවා.. කියන්න බලන්න.."

"මං අසාධාරණ දෙයක් ඉල්ලන්න නෙවෙයි ආවෙ.. හරිම සාධාරණ උදව්වක් ඉල්ලන්න.. කැමිසස් එකේ මගේ හිතවතෙක් වෙනුවෙන්.."

"කියන්න.."

"අහන්න වෙලාව තියෙනවද? දැන් කොහෙද යන්න නේද හැදුවෙ..?"

ඔහු දෑතින්ම මුහුණ පිසදා ගනියි.

"මහන්සියි.. ඒකයි කාවවත් එවන්න එපා කිව්වෙ.." ශාරීරික මහන්සියට වඩා ඇත්තේ මානසික පීඩාවයි. අද දවස පටන් ගත්තේ ම වින්ධ්‍යා සමග කළ වචන හුවමාරුව සමගින් ය.

කුසල් ගේ ඉල්ලීම ඔහුගේ සිතේ කෝපයක් ඇති කළේ ය. වින්ධ්‍යා හමුවේ පිට කළේ ඒ කෝපයයි.

"නීතිවිරෝධී දේවල් වලට එක එකා ගාව වැඳ වැටෙන්න මට බැහැ.. ඔයා වෙනුවෙන්වත් මට ඒක කරන්න බැහැ.. " ඔහු කෝපයෙන් කෑගැසුවේ ය. වින්ධ්‍යා එකටෙක කියන්නට නොආවා ය. ඒ ඇගේ ස්වභාවයයි. එකටෙක කියා රණ්ඩුවට එනවා නම් සිතේ කෝපය පහවන තුරු වචන හුවමාරු කර ගත හැකි ය. ඇගේ හිඟඩ බව නිසා සිතේ කෝපය සිත තුළම රඳවා ගන්නට ඔහුට සිදුව ඇත. එහි පීඩාව තවමත් ඔහුට දැනෙයි. ජන්ද දායකයන් හමුවීම කල් ඇතිව අවසන් කරන්නට සිතුවේ එනිසා ය.

"රණසිංහ අයිය අසනීපෙන්ද..? ඔයාගෙ මූණෙන් පේනවා... මං එහෙනම් වෙන දවසක එන්නං.." ආයෝමා අත් බෑගය අතට ගත්තා ය.

"එපා.. " ඔහු සිය සුරත ඇගේ අත මත තබා ඇය වැළඳුවේ ය. ".. කියන්න.. ආව කාරණේ කියන්න.. ඔයාට ඇතුම් කන් දෙන එක මට කරදරයක් නෙවෙයි.."

ලබන කළාපයට

27 වන පිටුවෙන් (සාගරයක් මැද)

උප්පරවැට්ටි යොදා ගැනීම නිසා මේ වන විටත් ශ්‍රී ලාංකීය සමාජය දරුණු ලෙස ව්‍යාධිගත වී ඇත. ජනවාර්ගික සිවිල් යුද්ධය ඉන් එකක් පමණය. මැතිවරණ ගැන මෙන් ම දේශපාලනඥයන් ගැනද, පොලිසිය ඇතුලු රාජ්‍ය ආයතන ගැන ද මහජන විශ්වාසය බිඳ වැටී තිබීම තවත් එකකි. සමස්ථයක් වශයෙන් ගත් කල බලයට පත්වීමේ අටියෙන් කාලයෙන් කාලයට කරලියට එන විරයන් සමාජය මුලාවේ හෙළීමට ගෙතූ මරුවැල් වල අනාගත පරපුරක් ම පැටලී සිටින හැටි පෙනේ. රටක් වැනසුනත් බලයට පත්වී සැප විඳීම පමණක් අරමුණු කරගත් පක්ෂ අනුගමනය කරන උපතුම රටක් ගොඩනැගීම අරමුණු කරගත් පක්ෂයකට ගැලපෙන්නේ නැත. මන්ද? පටලැවිල්ලක කර්තෘ කවුරු වුනත් පටලැවිල්ල ලිහන්නට සිදුවන්නේ රටක් ගොඩනගන පාර්ශවයට නිසාය. බණ්ඩාරනායක මහතා එ.ජා.ප. යෙන් ඉවත් වී, බලයට එන්නට මගක් සොයද්දී, රටේ නැගෙමින් තිබුණු සිංහල භාෂා පෙරමුණ ද තික්ෂු උද්ඝෝෂණ ද සමාජවාදී තරුණ ව්‍යාපාරයේ කම්කරු ජන රැල්ලද දුටුවේය. ඒ අනුව හෙතෙම වැල යන අතට මැස්ස ගසන්නට තීරණය කළේය. බලයට පත් වූ ගමන් ම බුදු දහම රාජ්‍ය ආගම බවට ද සිංහල බස රාජ්‍ය භාෂාව බවට ද පත් කරන්නෙම් යි පොරොන්දු වූ හෙතෙම, කම්කරු පංතියේ සතුරා හෙවත් පුද්ගලික ව්‍යවසායකයන් මට්ටු කර පොදු දේපොල ක්‍රමයක් හෙවත් ජනසතු ව්‍යාපාර ඇති කරන බව හඬ නගා කියා සිටියේය. කිරිගඟට ඇන්නා වගේ වැඩේ සාර්ථක විය. බණ්ඩාරනායක මහතා උඩින්ම බලයට පත්විය. කිව්ව පොරොන්දු ඉටු කරන්නට අතින් සතයක්වත් වියදම් දරන්නට ද ඔහුට සිදු නොවින. මන්ද ඒවා සැම එකක්ම වචන පමණක් වියැදුම් වූ ක්‍රියාවන්ය. නැත්නම් කොතැනකින් හෝ කාගෙන් හෝ පැහැරගැනීමක් නැත්නම් කාට හෝ පීඩාවක් ඇතිකිරීමක් පමණක් ම මිස අලුතින් කළ නිර්මාණයක් නොවන නිසාය. බණ්ඩාරනායක මහතාගේ පොරොන්දු ඉටු කිරීමෙන් උපන් අර්බුද තවම විසඳගන්නට බැරිව අපි අද ද ලත වෙමු. බණ්ඩාරනායක දර්ශණයෙන් ජාත වූ පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් ගැන මෑතක දී ඇමැති අමුණුගම කියා සිටියේ ඒවා ජාතික ධනය ගිලින මකරුන් කියාය. ඒ පහසුවෙන් බලයට එන්නට යෙදූ උප්පරවැට්ටිවල රහස. කවුද ඉතින්, ඒවට අද වගකියන්නේ? 1960 දී බලයට පත් වූ ආණ්ඩුව ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ආයෝජනය නොකළේ නම් හා 1977 දී බලයට පත් ආණ්ඩුව නිදහස් වෙළඳමටත් නිදහස් ආයෝජනයටත් ඉඩ සැලසුවේ නැත්නම් අද වන විට අප ලෝකයේ කාළකණ්ඩිම ජාතිය වන්නට ඉඩ තිබින. එසේ වී නමුත් ගැඳුරියට මැපීක් පෙන්නන්නට ගොස් උපන් එම අර්බුද අතරින් එකක් වන වාර්ගික සන්නද්ධ ගැටුම නිසා රට වල පල්ලට යාම වළක්වාගන්නට බැරිම තැනට අද පත් වී ඇති බව සිහි කල්පනාව හොඳ ඕනෑම ලාංකිකයෙකුට වැටහී යා යුතුය.

බණ්ඩාරනායක මහතා තම ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සංගම් හදන හැටි බලා, එ.ජා.ප.ය ද ජාතික සේවක සංගමය හදමින්, ජේ.ආර්. ජයවර්ධන මහතා යුරෝපීය ඇඳුමෙන් ජාතික ඇඳුමට මාරුවීමත්, ඔය කියන අන්දමේ පරණ අනුකරණයක් බව පැහැදිලිය. නමුත් එ.ජා.ප.ය 1977 දී බලයට පත් වූයේ ජේ.ආර්. ජයවර්ධන මහතා අලුතින් ඇඳගත් ඒ ජාතික ඇඳුම නම් විකාර කොපි කිට් එක නිසා නොව, එ.ජා.ප. පාලනය ගැන ජනතාවට තිබූ අතීත මතකයත්, 1970 සිට 1977 දක්වා සමගි පෙරමුණ පාලනය ඉවසන්නම බැරුව ආණ්ඩුවට විරුද්ධව ජනතාව සිය ජන්ද අයිතිය පාවිච්චි කළ නිසාත් ය. මහජන කැමැත්ත විකෘති කරන්නට රාජ්‍ය බලය යොදන්නටවත් බැරි ගානට ඒ ආණ්ඩුව පිරිහී තිබුණු නිසාය. එ මෙන්ම එ.ජා.ප. ක්‍රියාධරයන් හා සංවිධායකයන් කැපවීමෙන් ජන්ද අයිතිය රැකගන්නට ක්‍රියා කළ නිසාය. පුද්ගලයාගේ ප්‍රතිරූපයත් ඔහු සටනට බසිනා ඓතිහාසික අවකාශයත් අතර පවත්නා දායලෙක්තිකය වටහා ගැන්මට, විමල් වීරවංශ මහතාට මෙන්ම එ.ජා.ප.යේ සංශෝධනවාදී කණ්ඩායමත් අසමත්වීම ඇත්තෙන්ම ඒ ඒ පක්ෂවල අවාසනාවකි. බලය අහිමි වී විපක්ෂයේ සිටින විට වෙනත් ඕනෑම පක්ෂයකට සිදුවනවා මෙන්ම, එ.ජා.ප.ය ඇතුළට ද බාහිර දේපාලන ලෝකයෙන් දේපාලන අපදව්‍ය ගලා ඒමේ ප්‍රවනතාවය වැඩිය. ඉක්මනින් බලය ගැනීමට එජාපයට එන යෝජනා දෙස බලන විටත්, මෑත කාලයේ එ.ජා.ප.යේ පසුබෑමට හේතු වශයෙන් ඉදිරිපත්ව ඇති අදහස් දෙස බලන විටත් එය සනාථ වෙයි.

ජනාධිපතිවරයාගේ දෑත් ශක්තිමත් කිරීමට යැයි කියා එජාපයෙන් ආණ්ඩුවට යාත්‍රා කළ අයත් ඉන් පසු අලුත් නායකත්වයක් අපේක්ෂා කරන අයත් එ.ජා.ප.ය දැන් කළ යුතුව ඇත්තේ කුමක් නම් කියත් ද? ඔවුන් අත අලුත් දර්ශණයක් නවීන වැඩපිළිවෙලක් හෝ සැලසුම්කි තිබේද?

ඔගින්ද රාජපක්ෂ මහතා සිංහල ජනතාවගේ හදවතට කතා කරනවා-එයා දුප්පත් ළමයි වඩා ගන්නවා-ගෙවියන්ගේ ගෙවල්වලට ගොස් පිලේ වාඩිවෙනවා-තුන් සූත්‍රතරාම කටපාඩමින් කියනවා-ඉතින් මිනිස්සු එයාට ජන්දය දෙනවා-එයා දිනනවා-අපේ නායකයා එහෙම කරන්නේ නෑ-ඒව කරන්න කියල අපි කිව්වට නායකය අහන්නෙත් නෑ-ඒ නිසා අපි පරදිනවා. මේ කැරලි කාරයන්ගේ චෝදනාවේ හරයයි. ඉන් ඉල්ලා සිටින්නේ මහජනයා මුලාවේ හෙළීමේ අටියෙන් මගින්දු රාජපක්ෂ මහතා රගපානවා මෙන් එ.ජා.ප. නායකයාද ක්‍රියා කළ යුතු බවය. ශ්‍රී.ල.නි.ප. ය කරන දේ අනුකරණය කළ යුතු යැයි කීමය. ඉතින් එහෙම කරන්නට මගින්ද රාජපක්ෂ මහතා අපූරුවට ඉඳිත්දී තවත් කොපි මගින්දු කෙනෙක් කුමටද? එහිදා මෙය කිසිසේත්ම විචාරශීලී උපායක් නොවේ. තම පරාජයට හේතු සොයාගැනීමට අසමත් වූ විට ජයග්‍රාහකයා අන්ධානුකරණය කිරීම පෘතග්ජන මිනිසාගේ ගතියකි. වැඩ බැරි ළමයා පාසලේ දී ළග ළමයාගෙන් කොපිකරන්නේ ඒ අනුවය. සිය වරද වටහා ගැන්මට පින් මඳ වූ මූසිල ඇඳුරුතැන, දෙවි සහයලත් සිය ගුරු ගුත්තිල ඇඳුරු අවිචාරව අනුකරණය කොට, තත් කඩාගෙන, පටි රෝල් කර ගත්තේ ඒ අයුරින්මය.

ශ්‍රී.ල.නි.ප.ය ක්‍රියා කරන්නේ එයට ගැලපෙන ආකාරයෙනි. එ.ජා.ප.ය සාර්ථක වන්නේ ඊට ගැලපෙන ආකාරයට එය ක්‍රියා කළ විටය. ජ.වි.පෙ. හෝ තවත් පක්ෂයක් ක්‍රියාකරන්නේත් ඒ ඒ පක්ෂකට උරුම රිද්මයකටය. ඉතින් එ.ජා.ප.ය ක්‍රියා කළ යුත්තේ ඊට උරුම රිද්මයට අනුව මිස අනුන්ගේ රිද්මයට නොවේ. එනම් ඒ පක්ෂයේ අවසන් ඉලක්කය හෙවත් අවසන් අරමුණ අනුවය. ජ.වි.පෙ.ට කිසිකලෙකත් ශ්‍රී.ල.නි.ප.ය බවට පත්වන්නට නොහැකිය. ඒ නිසා විරවංශ මහතා කියන හැටියට මහජනයා මුලාවේ හෙළීමේ අටියෙන්, දේශපාලන වෙස් නැටුම් නැටුවෝතින්, එහි ආයුෂ දිගු කල් රැඳෙන්නේ නැත. අත්තෙන්ම ඒවා උපායන් නොව රැවටීමය. මන්ද කියනවානම්, යම් පක්ෂයක් උපායක් ලෙස රැවටීම යොදාගන්නේ, තම සතුරාට එරෙහිව පමණය. රැවටීම ජනතාවට එරෙහිව නම් එම සංවිධානය, ජනතාවට එරෙහි සතුරු සංවිධානයකි. (මා ඕ සේතුං) ජ.වි.පෙ. මේ දක්වා යම් පසුබෑමක් අත්කරගෙන ඇත්නම් ඒ විමල් වීරවංශ මහතා දක්වන නායකත්ව ප්‍රශ්න නිසා නොව, අර අන්දමට ජනතාව ඇන්දවීමට යොදා ගත් උපාමාරු නිසාය. ඒ ඇන්දවීම් නිසා ඔවුන් ජනතාවට අප්පිරියා වීම නිසාය.

සාමාන්‍ය වශයෙන් ශ්‍රී.ල.නි.ප.යේ අවසන් අරමුණ කුමක් ද? එහි නායකයන් කටින් සිටුවන බතල කොල කුමක් වුවත් ඉතිහාසයට අනුවනම් එහි ඒකායන අරමුණ කොක්කෙන් නැත්නම් කෙක්කෙන් හරි බලයට පත් වීම පමනය. බලයට පත්වීමෙන් පසු වල ඉහගැනීම හැර ඉන් එහාට කිරීමට තවත් අරමුණක් ඊට නැත. කරල් සොරා කෙතට ඇතුලු වන්නේ කරල් කපා ගැන්මට මිස වල් නෙළීමට නොවේ. ජන්ද කාලයේදී ජනතාවට වූ පොරොන්දු බල්ලට දමා, එහි නායකයන් එක්කෝ එන එන අතකට නැමී නැමී ලූයි බොනපාටිලා බවට පත්වන්නේ හෝ නැත්නම් රට ගොඩනැගීම පසෙක තබා තම පවුල් ගොඩ නැගීම ආරම්භ කරන්නේ ඒ නිසාය. බණ්ඩාරනායක ශ්‍රීමතාතන් ගේ සිට ජනරංජන මගින්දු රාජපක්ෂ මහතා දක්වාම එම පක්ෂය ඔප්පුකර ඇත්තේ එයයි. කේපු කෑළල ඩහඟගන්නා තෙක් ඕනෑම බොරුවක් කීම ඒ පක්ෂයේ පිළිවෙලට අනුව වරදක් නොවේ. මුලින් රැවටුණු ජනයා දෙවන වර රැවටිය යුත්තේ අලුත් උපායකිනි. ඉතින් විරවංශ මහතා කියන ආකාරයේ අර මහජනයා රැවටීමේ උපාය හරියන්නේ ශ්‍රී.ල.නි.ප.යටය.

නමුත් එ.ජා.ප.ය ට බලයට පත්වීම පමණක් අවසන් අරමුණ කරගත පැවතිය හැකි පක්ෂයක් නොවේ. ඊට ඉන් එහා දුර යන, රට ගොඩනැගීමේ අරමුණක් ද ඇති පක්ෂයකි. 1948 න් පසු තබා ඇති රටේ මහා සංවර්ධන මංසලකුණුවල උරුමය ඒ පක්ෂයට හිමිවන්නේ එහෙයිනි. ඒ නිසා මොනවා හෝ උප්පරවැට්ටියක් කොට බලයට පත්වීම එහි පැවැත්මට හානිකරය. රටක් ගොඩනැගීමේ අරමුණ ඇති පක්ෂයක් රටක ජනතාවගේ විශ්වාසය හා ගෞරවය දිනා සිටිය යුතුය. එසේ වන්නේ ජනතා විශ්වාසය හා ගෞරවය නොමැතිව රටක් ගොඩනැගීමේ සැලසුම් සාර්ථක කරගත නොහැකි නිසාය. මේ නිසා ජ.වි.පෙ අදැඳුම හෝ ශ්‍රී.ල.නි.ප.යේ ඇඳුම එ.ජා.ප.යට අන්දවන්නට යාම විකාරයකි.

ශ්‍රී.ල.නි.ප. ය ආරම්භයේ දී බලයට පත්වීම උදෙසා ඔසවා ගත් බෑනර අද වන විට එකින් එක ඕම වැටී දිරා ගොස් සමාජ ශාප බවට පත්ව ඇත. අවසන් බෑනරය ලෙස ඉතිරි වී ඇත්තේ ජ.වි.පෙන් උදුරා ගත් දේශප්‍රේමී බෑනරය පමනි. මවුබිම නැත්නම් මරණය කිය කියා ගෝරිල්ලෙකු මෙන් පපුවට තලා ගනිමින්, රාජපක්ෂ මහතා ගුගුරන්නේ සිය පැවැත්ම එය මත රැඳී ඇති බැවිනි. එක්කෝ ඔහු මවුබිම නැත්නම් මරණය දිනාගන්නා තෙක් බලා සිටිනවා විනා ජ.වි.පෙ.ට වත් එ.ජා.ප.යට වත් වැදගත් දේශපාලන අවකාශයක් ලැබෙන්නේ නැත. සෝමවංශ සහෝදරයා හෝ ටිල්වින් සිල්වා සහෝදරයා වෙනුවට විරවංශ නැත්නම් නන්දන ගුණතිලක යන සහෝදර වරු මාරු කිරීමෙන් මෙම යථාර්ථය තුළ අත්පත් කරගත හැකි කෙංගෙඩියක් නැත. කෙටියෙන්ම කියනවානම්, මගින්දු මහතාගේ බෑනරයේ එල්ලීමෙන් ජ.වි.පෙ.ට වාසියක් අත්වන්නේනැත. ඒ බෑනරය ද දිරාපත්වන තෙක් ඔහුටම ඔසවාගෙන ඉන්නට ඉඩහළ යුතුය.

ඔනෑම චෞරයෙකු අවසාන වශයෙන් ඔසවා ගන්නේ දේශප්‍රේමී බෑනරය බව ලෝකයාගේ පිළිගැනීමය. ශ්‍රී.ල.නි.ප.ය අනුගමනය කළ පැරණි උප්පරවැට්ටි මගින් සිදුවූවාටත් වඩා පිරිමැසිය නොහැකි හානියක් මෙවර එමගින් සිදු කරනවාට සැකයක් නම් නැත. නැවත සමගි කරවීමට බැරි තරමටම රටේ ජනතාව චාර්ගික වශයෙන් විතැන්කරවීම වුවද පිරිමැසිය නොහැකි දැවැන්ත හානියකි.